**රාජාංගනය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 14 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 14 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්තවාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | බැකෝ ලෝඩර් යන්ත්‍රයේ සහ වතුර බවුසර ලොරියෙහි (Water Tank Truck) රු.27,433,434 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.25,879,253 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.1,554,181 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතු වේ. | 2019 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | කසල අංගන ගොඩනැගිලි ඉදිකිරීමේ රු.4,867,675 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.4,602,913 ක් ලෙස දක්වා තිබීම නිසා රු.264,762 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතු වේ. | පිළිගනිමි. |
| (iii) | උසාවි දඩ ආදායම රු.2,834,663 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.3,564,664 ක් ලෙස දක්වා තිබීම නිසා රු.730,001 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | පිළිගතිමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ රු.930,000 ක මුද්දර බදු ගිණුම්ගත කර නොතිබුණු අතර 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,257,697 මුද්දර බදු ආදායම මුල්‍ය ප්‍රකාශනවල රු.926,572 ක් ලෙස දක්වා තිබුණු බැවින් තිබුණු බැවින් එකතුව රු.1,261,125 අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගතිමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි ඇතුලත් වර්ග 05 කට අයත් භාණ්ඩ ඒකක 62 ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ දක්වා නොතිබුණි. | අදාල ශේෂ වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලේඛන අනුව ආදායම් විෂයයන් 02 ක් සහ හිඟ ආදායම් ගිණුම් විෂයයක රු.6,580,545 ක්වූ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.9,446,279 ලෙස දක්වා තිබීම නිසා රු.2,865,734 වෙනසක් විය. | අදාල ශේෂ වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ 03 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.2,400,721 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම ලැබිය යුතු ගිණුම් ශේෂ 08 කාගෙන් ලැබිය යුතුදැයි නිශ්චිතව සනාථ කර ගත නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.2,656,900 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු අදාල ශේෂ හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කල යුතු වේ. | මෙම ගෙවිය යුතු ශේෂ 07 අතුරින් ගෙවිය යුතු මුද්දර ගාස්තු හා නොගෙවූ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂිත පිළිබඳව අදාල අංශ වෙතින් විමසීමක් කර එම මුදල් පියවීමේ කටයුතු කිරීමට සටහන් තබා ගත් අතර වියදම් ණයහිමියෝ , විනෝද බදු, අත්තිකාරම් නිලධාරී, විවිධ තැන්පත්, හා ජල තැන්පත් ආදියෙහි ගෙවීමට ඇති පාර්ශ්ව හඳුනා ගත නොහැක. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.134,935,236 ක් ගිණුම් විෂයයන් 09 කට අදාලව වත්කම් ලේඛන, වයස් විශ්ලේෂණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගතිමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

----------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| i රීති 59 | සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ලේකම්වරයා වෙත ඉදිරිපත් | රීති අනුව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. සමීක්ෂණයක් පවත්වා ඇතත් වෙනම ලේඛනයක් සකස් කිරීම සිදු කර නොමැති බව පිළිගතිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කර නොතිබුණි. | | 2019 වර්ෂය සඳහා වෙනම ලේඛනයක් සකස් කර ඇත. |
| ii | රීති 217හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස. 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ සිට උපදෙස් අනුව කටයුතු කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ | | | |
| i. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 13 ක් සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. | 2019 වර්ෂයේ සිට කටයුතු කරමි. |
| ii | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්ගේ 2009 ජූනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අතිකාල දීමනා සහා නිවාඩු දින වැටුප් ගෙවීමේදි ඇගිලි සැලකුණු යන්ත්‍ර අනුව පැය ගණනය කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. 2019 වර්ෂයේ ජූනි මාසය දක්වා ක්‍රියාත්මක කර නොමැත. ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් තබා ගතිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,296,376 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,779,625 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,409,400 | 1,558,592 | 1,558,592 | - | 868,000 | 1,221,637 | 1,221,637 | - |
| කුලී | 3,648,200 | 7,272,191 | 7,190,991 | 120,750 | 4,049,000 | 5,397,395 | 5,357,845 | 39,550 |
| බලපත්‍ර ගාස්තු | 966,100 | 144,480 | 144,480 | 220,425 | 140,000 | 177,935 | - | 220,425 |
| වෙනත් ආදායම් | 26,245,874 | 20,268,346 | 31,831,684 | 4,251,309 | 23,763,280 | 29,144,214 | 13,329,567 | 15,814,647 |
| එකතුව | 33,269,574 | 29,243,609 | 40,725,747 | 4,592,484 | 28,820,280 | 35,941,182 | 19,909,049 | 16,074,622 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි | පනත අනුව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. වරිපනම් හා බදු පැනවීමට අවශ්‍ය කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.3,324,736 ක් විය. | උසාවි දඩ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇත. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලැබිය යුතු මුද්දර බදු ආදායම රු.2,341,550 ක් අයකර ගෙන නොතිබුණි. | බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මේ වන විට මුද්දර ගාස්තු ශේෂය නිරවුල් කර ගෙන ඇති අතර දැනට අයවීමට ඇත්තේ රු.1,587,500ක් පමණි. එම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 10 ක් පනවා ඇත. ඉතිරි අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පැනවීමට කටයුතු කරමි. |

(ආ). තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය දැනුවත් වී නොතිබුණි | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රවලට අනුව කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ මේ වන විට අධ්‍යනය කරමින් පවතී. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.376,590,580 ක වටිනාකමකින් යුතු ජ'නල සටහන් 99 ක් සඳහා කිසිදු අනුමැතියක් ලබානොගෙන ගිණුම්ගත කර තිබුණු අතර ඒ අනුව ගිණුම් තැබීමේ කටයුතු පිළිබඳව වගකිවයුතු නිලධාරීන් නිසි අධීක්ෂණයන් සිදුකර නොතිබුණි. | නිසි අධීක්ෂණයක් යටතේ ජ' නල සටහන් අනුමත කල යුතු වේ. | 2019 වර්ෂයේ සිට නිවැරදි කර අධීක්ෂණය කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | පූර්ව වර්ෂ ගණනාවක සිට සභාව විසින් අයකර ගෙන තිබුණු රු.1,248,383 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු වේ. | මෙම ශේෂය හඳුනා ගත නොහැකි බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ සේවක පුරප්පාඩු තනතුරු 8 ක් පැවති අතර අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. | සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර අදාල තනතුරට සුදුසුකම් ඇති නිලධාරින් පත්කර ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කල යුතු වේ. | පිළිගතිමි.<br>පළාත් පාලන කොමසාරිස්තුමියට හා රාජ්‍ය සේවා කොමිෂමට විස්තර යවා ඇත. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරින් 5 ක ගෙන්ද, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 05 ක ගෙන් වැඩ තහනම් වු නිලධාරින් 03 දෙනෙකුගෙන් සහ වෙනත් නිලධාරින් 03 දෙනෙකුගෙන්ද අයවිය යුතු රු.973,017 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | ණය ශේෂ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කලයුතු වේ. | ස්ථාන මාරු වී ගිය අයගෙන් මාසිකව ණය අය වෙමින් පවතින අතර අනෙක් අයගේ ශේෂ වසර ගණනාවක සිට පැවත එන අතර සභා අනුමැතියක් ලබා ගෙන පළාත් පාලන කොමසාරිස්තුමිය හරහා කපා හැරීමක් සිදු කිරීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන රු.8,910,000 ක වටිනාකමින් යුතු වාහන 4 ක් සභාව වෙත අයිතිය ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේදී පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් 56 ක අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | අයිතිය පවරාගෙන ගිණුම්ගත කල යුතු වේ. | 2019 වර්ෂයේදී පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.දැනටමත් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගැනීමට අවශ්‍ය ඉල්ලීම් කර ඇත. |

3.4.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේදී සභාව වෙත ලැබුණු රු.2,655,318 වටිනා ෆෝටෝන් වර්ගයේ ට්‍රැක්ටරය වසර කිහිපයක සිට ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | අවශ්‍ය අලුත් වැඩියාවන් සිදුකර එම වත්කම උපරිම ධාරිතාවයකින් කාර්යක්ෂමව භාවිතා කල යුතුවේ. | අමතර කොටස් නොමැති වීම හේතුවෙන් මෙතෙක් අළුත්වැඩියා කිරීමට නොහැකි විය. 2019 වර්ෂයේ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිතයි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා පරිශ්‍රයේ රඳවා තිබෙන අංක 53-5052 දරණ මිට්සුබිෂි කැබ්රථය අක්‍රීය තත්වයේ පවතින අතර මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | 2019 වර්ෂයේ අපහරණය කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |